# මූලික තොරතුරු ලේඛනය (KFD) රථ වාහනණය (Auto Loan)
## ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී

**1. නිපැයුම – රථ වාහන ණය**

මෙම නිපැයුමේ පරමාර්ථය වන්නේ වාහනයක් (මෝටර් රථ සහ ද්විත්ව කාර්ය රථ) උකස් කිරීම මඟින් ගණුදෙනුකරුවන්ගේ පුද්ගලික සහ ව්‍යාපාර අවශ්‍යතා සම්පූර්ණ කිරීම පිණිස ඔවුන්ගේ විවිධාකාර මූල්‍ය අවශ්‍යතා සපුරාලමින්, ගණුදෙනුකරුවන් සඳහා මූල්‍ය සහයෝගය ලබාදීමයි.

**2. ප්‍රධාන ලක්ෂණ සහ ප්‍රතිලාභ**

අ) ආකර්ශණීය පොලී අනුපාත.
ආ) ණය ලබදීමේ අවම කාලය
ඇ) වසර 5ක් දක්වා ආපසු ගෙවීමේ කාලය
ඈ) ඉක්මන් ගණුදෙනුකාර සේවය

**3. සුදුසුකම්: අයැදුම්කරු**

අ) වයස අවුරුදු 18ට වැඩි සහ අවුරුදු 65ට අඩු ශ්‍රී ලාංකික පුරවැසියෙක් විය යුතුය
ආ) පිළිගත හැකි/ සනාථ කළ හැකි ආපසු ගෙවීමේ හැකියාවක් තිබිය යුතුය
ඇ) පැහැදිලි අතීත වාර්තාවක් තිබිය යුතුය. (සෑහීමකට පත් විය හැකි CRIB වාර්තා)
ඈ) පහසුකම ඉල්ලා සිටින පරමාර්ථය නීත්‍යානුකූල විය යුතුය

**4. පොලී අනුපාත සහ වෙනත් ගාස්තු**

**4.1 පොලී අනුපාත**

කලින් කල වෙළඳපොළ තත්ත්වයන් මත පදනම්ව ALCO කමිටුව මඟින් ගන්නා තීරණ අනුව පොලී අනුපාත තීරණය කරනු ලැබේ.

**4.2 අනෙකුත් ගාස්තු**

**4.2.1. ලේඛන ගාස්තු**

| | |
|---|---|
| රුපියල් 500,000 දක්වා | 7,500.00 |
| රුපියල් 500,000 - රුපියල් 999,999 | 9,000.00 |
| රුපියල් 1,000,000 - රුපියල් 1,999,999 | 11,000.00 |
| රුපියල් 2,000,000 - රුපියල් 2,999,999 | 12,500.00 |
| රුපියල් 3,000,000 - රුපියල් 4,999,999 | 15,000.00 |
| රුපියල් 5,000,000ට වැඩි | 17,500.00 |

**4.2.2. ගාස්තු - චංචල දේපළ වෙනුවෙන් ප්‍රදානය කරන පහසුකම්**

රජයේ අනුමත මෝටර් රථ දෙපාර්තමේන්තුවේ ලියාපදිංචි/ පැවරුම් ගාස්තු අදාළ වේ.

**4.2.3 නියමිත දිනට මාසික වාරික නොගෙවීම/ ප්‍රමාද වී ගෙවීම මත අය කරන දඩපොලිය (අදාළ වන්නේ නම්)**

නියමිත දිනට වාරික නොගෙවන්නේ නම් ප්‍රමාද වූ කාලසීමාව මත සියයට තුනක (3%) ප්‍රමාද ගාස්තුවක් අය කෙරේ.

**4.2.4 පහසුකම කලින් පියවීම/ නිරවුල් කිරීම**

නියමිත දිනට පෙර එකවර ණයකරුවා විසින් ණය මුදල කලින් පියවීමක දී පහසුකම වෙනුවෙන් අනාගත පොලිය සඳහා සහනයක් ප්‍රදානය කිරීම MBSL ආයතනයේ පූර්ණ අභිමතය මත සිදු වේ.

**4.2.5 අදාළ අනෙකුත් ගාස්තු**

| අංකය | අය කිරීම/ගාස්තුව පිළිබඳ විස්තරය | අය කිරීම් / ගාස්තු (රුපියල්) |
|---|---|---|
| 1 | ශේෂය තහවුරු කිරීම | 1,000.00 |
| 2 | හිඟ නොමැති බවට ලිපි | 250.00 |
| 3 | ගණුදෙනුකරුගේ ආපසු ගෙවීමේ ඉතිහාසය | 250.00 |
| 4 | පරම අයිතිය අහෝසි කිරීමේ ලිපියේ අනු පිටපත් - සියලුම වාහන සඳහා | 2,000.00 |
| 5 | විරෝධතා නොමැති බවට ලිපි සහතික කෙරෙන ලිපි | 1,000.00 |
| 6 | ශේෂය තහවුරු කිරීම | 1,000.00 |
| 7 | ණය පියවීමේ ලිපි/ ණය නිරවුල් කිරීමේ ලිපි | 750.00 |
| 8 | ණයදෙන්නන්/ ගැනුම්කරුවන් සඳහා ඉන්වොයිසිය | 1,500.00 |
| 9 | අගරු චෙක්පත් ගාස්තු | 2,500.00 |
| 10 | අගරු චෙක්පත් - අණකරු විසින් නතර කර ඇති ගෙවීම් | 5,000.00 |

**5. ප්‍රදානය කිරීම සඳහා ලබා ගැනීමට අවශ්‍ය ද්‍රව්‍යයේ, හෙළිදරව්වේ සහ සුරැකුම් වර්ගය**

අ) චංචල දේපළ

අභ්‍යන්තර තක්සේරු නිලධාරියා ලබා දෙන වෙළඳපොළ වටිනාකම 70% ක් දක්වා - SM CCD.

ආ) මෝටර් රථ සහ ද්විත්ව කාර්ය ද්‍රව්‍ය වන ජනප්‍රිය චංචල ද්‍රව්‍ය

**6. අනුගමනය කළ යුතු කාර්යපටිපාටිය**

- ණය ගැනීමට කැමති උනන්දුවක් දක්වන සියලුම ගණුදෙනුකරුවන්ට ලඟම ශාඛාව වෙත ගොස් ඔවුන්ගේ අවශ්‍යතාවන් ගැන සාකච්ඡා කර ගත හැක.
- සාකච්ඡාවෙන් පසුව, ශාඛාව මඟින් ගණුදෙනුකරුගේ අවශ්‍යතාව අනුව කාර්යපටිපාටිය ඇගයීම සහ ක්‍රියාවලිය ආරම්භ කරනු ඇත.

- ණය අනුමැතිය ආයතනික නීතිරීති මාලාවට යටත්ව සිදු කෙරෙන අතර ණය අනුමත කිරීමේ හෝ නොකිරීමේ පූර්ණ අභිමතය MBSL සතු වේ.

**6.1 අවශ්‍ය ලේඛන**

**6.1.1 තනි පුද්ගල ගණුදෙනුකරුවන්**

i. නිසි පරිදි සම්පූර්ණ කළ අයැදුම්පත්‍ර ආකෘතිය/ වත්කම් ප්‍රකාශ කිරීමේ ආකෘතිය
ii. ජාතික හැඳුනුම්පතේ පිටපත (NIC පිටපත)
iii. බිල්පත් සාක්ෂි/ බිල්පත් තහවුරු කිරීමේ ලේඛනය (ලිපිනය තහවුරු කිරීමේ ලේඛනය)
iv. පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශන (පුද්ගලික සහ ව්‍යාපාරික)
v. මුදල් ප්‍රවාහ ප්‍රකාශන/ආදායම් වියදම් ප්‍රකාශන
vi. CRIB වාර්තා (පුද්ගලික සහ ව්‍යාපාරික)
vii. ව්‍යාපාර ලියාපදිංචි කිරීමේ (BR) පිටපත (තිබෙන්නේ නම්)
viii. ආදායම සනාථ කිරීමේ වෙනත් ලේඛන

**6.1.2 ආයතනික ගණුදෙනුකරුවන්**

**සීමාසහිත සමාගම් / ප්‍රකාශිත සමාගම්**

i. සංස්ථාගත කිරීමේ සහතිකය
ii. සාංගමික ව්‍යවස්ථාවලිය
iii. 1 වැනි ආකෘතියේ, මෑතකදී ගත් 13 වැනි ආකෘතියේ, 15 වැනි ආකෘතියේ, 20 වැනි ආකෘතියේ පිටපත්
iv. බදු ගෙවීමේ කුවිතාන්සි/ආදායම් බදු (මෑතකාලීනම).
v. අධ්‍යක්ෂ මණ්ඩල යෝජනාව හා අනුමැතිය
vi. පසුගිය වසර තුනේ විගණනය කළ ගිණුම්.
vii. ප්‍රවර්තන වර්ෂයේ කළමනාකාරීත්වයේ ගිණුම්/මුදල් ප්‍රවාහ ප්‍රකාශන
viii. පසුගිය මාස 6ක බැංකු ප්‍රකාශන
ix. CRIB වාර්තා (ව්‍යාපාර / අධ්‍යක්ෂවරු)
x. අවශ්‍ය අනෙකුත් වෙනත් ලේඛන.

**6.1.3 අවශ්‍ය ලේඛන (ඇපකරුවන්)**

i. ඇපකරු අයැදුම්පත්‍රය සහ වත්කම් ප්‍රකාශ කිරීමේ ආකෘතිය
ii. ජාතික හැඳුනුම්පතේ පිටපත
iii. ආදායම් ප්‍රකාශන (වැටුප් සහතික ලිපි/ මෑත කාලීන වැටුප් පත්‍රිකාt/ බැංකු ප්‍රකාශන

**6.2 සුරැකුම්පත්වලට සම්බන්ධ ලේඛන - වංචල**

- ලියාපදිංචි කිරීමේ මුල් සහතිකය
- වාහනයේ පරම හිමිකාරත්වය
- තක්සේරු වාර්තාව
- අලෙවි ඉන්වොයිසිය

## 7. පොදු

- ව්‍යාපාරික ස්ථානයේ (නාම පුවරුව සමඟ) සහ සුරැකුමේ ඡායාරූප
- ස්ථානීය පරීක්ෂණ වාර්තාව
- ණය අවශ්‍යතාව තහවුරු කිරීම සඳහා ලේඛන

## 8. ප්‍රධාන නියම සහ කොන්දේසි

අ) අයැදුම්කරුවන් වෙත පූර්ව දැනුම්දීමකින් තොරව හෝ ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී ආයතනයට (MBSL) අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී ඉල්ලුම මත ණය ආපසු ගෙවිය යුතුය.

ආ) වාහනය සම්බන්ධයෙන් කිසිදු උකස්කරයක්, ලියමක් හෝ වෙනත් බැඳීම් ඇති නොකිරීමට හෝ ඇති කරනු නොලැබීමට අයැදුම්කරුවන් පොරොන්දු ගිවිස ගනී.

ඇ) MBSL ආයතනයට අයැදුම්කරුගේ ව්‍යාපාර පොත් පරීක්ෂා කිරීම සඳහා හිමිකමක් ඇත.

ඈ) ගෙවිය යුතු ගාස්තු අය කර ගැනීමේ කාර්යය සඳහා අයැදුම්කරුගේ ව්‍යාපාර ස්ථානයට හෝ නිවසට පැමිණීමට MBSL නිලධාරීන්ට බලය ඇති අතර එවැනි පැමිණීම් සඳහා ගාස්තු අයැදුම්කරු විසින් දැරිය යුතුය.

ඉ) MBSL මඟින් ව්‍යාපාර පරීක්ෂා කිරීමේ කාර්යය සඳහා කලින් කලට තීරණය කරනු ලබන පරිදි අයැදුම්කරුගේ/ සහ හෝ ඇපකරුවන්ගේ ව්‍යාපාරික පරිශ්‍රවලට හෝ නිවාසවලට පැමිණීමට MBSL ආයතනයට අයිතිය ඇත. අදාළ අයැදුම්කරුට සහ/හෝ ඇපකරුවන්ට පූර්ව දැනුම්දීමක් ඇතිව හෝ නොමැතිව එවැනි ව්‍යාපාර පරීක්ෂා කිරීමක් සිදු කළ හැකිය.

ඊ) අර්පණ ලිපියේ කොන්දේසි සියල්ල හෝ අර්ධ වශයෙන් හෝ අනෙකුත් සියලු කොන්දේසි ඇතුළත්ව අදාළ පාර්ශ්ව අතර රථ වාහන ණය ගිවිසුමක් සකස් කර අත්සන් තැබීම මඟින් ණය ගිවිසුම බලාත්මක වන්නේය.

උ) අයදුම්කරුවන් විසින් රථවාහනයේ වටිනාකම සඳහා පිළිගත හැකි රක්ෂණකරුවෙකුගෙන් විස්තීර්ණ රක්ෂණාවරණයක් ලබා ගත යුතු අතර එය MBSL සඳහා පවරනු ලැබිය යුතුය. තව ද එවැනි විස්තීරණ රක්ෂණය වාර්ෂිකව අලුත් කර MBSL වෙත භාර දිය යුතුය. ඉහත කොන්දේසිය පිළිපැදීමට අපොහොසත් වුවහොත් එය අලුත් කිරීමේ අයිතිය MBSL රඳවා ගන්නා අතර ගාස්තු අයදුම්කරුගේ ණය ගිණුමට හර කරනු ලැබේ.

ඌ) MBSL ආයතනය ඉහත සඳහන් කළ වාහනයේ පරම හිමිකරු ලෙස ලියාපදිංචි කරනු ලබන අතර MBSL ආයතනයට අවශ්‍ය පරිදි සහ අවශ්‍ය වේලාවේ දී ලියාපදිංචි හිමිකම MBSL ආයතනයට පැවරිය යුතුය. අයැදුම්කරුට වාහනය තබා ගැනීමට හිමිකම් ඇති නමුත් ඉල්ලා සිටින විට එහි අයිතිය MBSL ආයතනය වෙත භාර දිය යුතුය. එමෙන්ම MBSL ආයතනය මඟින් අවශ්‍ය යැයි සලකනු ලබන ඕනෑම අවස්ථාවක දී හෝ ස්ථානයක දී එකී වාහනයේ හිමිකම ලබා ගැනීමටත් අවශ්‍ය ඕනෑම අවස්ථාවක දී MBSL ආයතනයේ අභිමතය පරිදි ඕනෑම ආකාරයකින් වාහනය බැහැර කිරීමටත් MBSL ආයතනයට හිමිකම් ඇත.

## 9. අවසන් කිරීම සහ ප්‍රතිසාධනය - නෛතික කාර්යපටිපාටිය

මෙහි මෙයට පෙර සඳහන් කර ඇති පරිදි MBSL මඟින් පහසුකම අවසන් කරනු ලබන අවස්ථාවක දී අයැදුම්කරුට/ අයැදුම්කරුවන්ට සහ/හෝ ඇපකරුට/ ඇපකරුවන්ට එරෙහිව නීතිමය පියවර ආරම්භ කිරීමටත් මුද්දර ගාස්තු, නීති ගාස්තු ආදිය ඇතුළුව නෛතික ක්‍රියාවලියට දරන ලද සියලුම පිරිවැය සමඟ MBSL වෙත අයවිය යුතු මුදල් ආපසු අය කර ගැනීම පිණිස සපයා දී ඇති ඇපකරය පෙරවරණය කිරීමටත් MBSL ආයතනයට හිමිකමක් ඇත.

**9.1 අදාළ වන නෛතික විධිවිධාන**

අ) සංශෝධිත පරිදි 1946 අංක 06 දරන උකස් පනත
ආ) 1982 අංක 29 දරන පාරිභෝගික ණය පනත
ඇ) ගිවිසුම් නීතිය
ඈ) ශ්‍රී ලංකාවේ සිවිල් සහ අපරාධ නීතිය
ඉ) 2009 අංක 49 දරන සුරක්ෂිත ගනුදෙනු පනත
ඊ) 1998 අංක 21 දරන හිමිකම් ලියාපදිංචි කිරීමේ පනත
උ) 1995 අංක 11 දරන බේරුම්කරණ පනත
ඌ) 1988 අංක 72 දරන සමථ මණ්ඩල පනත
එ) 1990 අංක 2 දරන ණය ආපසු අය කර ගැනීමේ (විශේෂ විධිවිධාන) පනත
ඒ) 1990 අංක 14 දරන දේශීය භාර ලදුපත් පනත
ඔ) 2011 අංක 42 දරන මූල්‍ය ව්‍යාපාර පනත
ඕ) 2017 අංක 24 දරන දේශීය ආදායම් පනත

**10. පැමිණිලි කළමනාකරණ කාර්යපටිපාටිය**

ගණුදෙනුකරුවන්ට අපගේ නිමැවුම් හෝ සේවාවන් පිළිබඳ පැමිණිලි;

අ) ළඟම පිහිටි ශාඛාවට පැමිණ ශාඛා කළමනාකරු වෙත පැමිණිල්ල යොමු කිරීම.

ආ) අපගේ පාරිභෝගික සත්කාර හදිසි ඇමතුම් අංකය 011 - 4 711 711 හරහා ඇමතුමක් දීමෙන් **හෝ** info@mbslbank.com / customercare@mbslbank.com යන විද්‍යුත් තැපැල් ලිපිනයන්ට විද්‍යුත් තැපැලක් එවීමෙන් ඔබේ පැමිණිල්ල යොමු කළ හැකිය.

ඇ) ලිඛිත පැමිණිලි තැපැලෙන් - පහත ලිපිනයට එවිය හැකිය;

**සහකාර නියෝජ සාමාන්‍යාධිකාරී අලෙවිකරණ - නිපැයුම් කළමනාකරණ, දේපොළ වෙළඳාම්,**
**පාරිභෝගික පැමිණිලි කළමනාකරණ සහ සහාය සේවා**
**ශ්‍රී ලංකා මර්චන්ට් බැන්ක් ඇන්ඩ් ෆයිනෑන්ස් පීඑල්සී**
**අංක 28, BOC මර්චන්ට් කුළුණ**
**ශාන්ත මයිකල් පාර**
**කොළඹ 03.**